# ප්‍රජා සහභාගීත්ව සංවර්ධනය හා ගැමි පිවිසුම් ක්‍රමවේදයේ ඇති වැදගත්කම

මහකච්චකොඩියේ පඤ්ඤාසේකර හිමි

## හැඳින්වීම

සංවර්ධනය යනු භෞතික මෙන්ම අභෞතික සියලු අංශයන්හී ඇතිවන දියුණුවකි. සියලු දෙනාගේ උත්සාහය වී ඇත්තේ ද තමා තුළත් තම ආයතනය තුළත් හා තම රටේ සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒමයි. එහෙත් එය වෙහෙසක් පමණක් වන අතර ඉලක්කගත සංවර්ධනයක් කරා ගමන් කරන්නේ අතලොස්සකි. එයට හේතුව විධිමත් සංවර්ධන සැලැස්මක් නොමැති වීමයි. මෙම දුර්වලතාවය අවබෝධ කරගත් ආර්ථික විශ්ලේෂකයන් ප්‍රජා සහභාගීත්වය දියුණු කරගැනීම තුළින් බලාපොරොත්තු සංවර්ධනයක් කරා ගමන් කිරීමට හැකියාවක් ඇති බව පෙන්වා දී ඇත. එම නිසා නූතන සංවර්ධන ක්‍රියාදාමයේ ප්‍රජා සහභාගීත්වය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් කටයුතු කරන අයුරක් දැකිය හැකිය. එසේ දුර්වලතා මඟ හරවා ගනිමින් ලබා ගන්නා සැබෑ සංවර්ධනයේ ස්වභාවය කෙබඳු ද යන්න විමසා බැලිය යුතුය. සංවර්ධනය සම්බන්ධයෙන් විවිධ අර්ථ නිරූපණ රැසක් ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්ට අදාළව ඉදිරිපත් වී ඇති ආකාරයක් දැකිය හැකිය. ආර්ථික විද්‍යාඥයින් තම විෂයට අදාළවත්, සමාජ විද්‍යාඥයින් තම විෂයට අදාළවත් දේශපාලන විද්‍යාඥයින් තම විෂයට අදාළවත් විවිධ ආකාරයෙන් සංවර්ධනය සම්බන්ධයෙන් අර්ථ දක්වා ඇත.

ආර්ථික විද්‍යාඥයින් සංවර්ධනය හඳුන්වා දී ඇත්තේ පුද්ගලයින්ගේ ජීවන තත්වය උසස්වන ක්‍රියාවලියක් ලෙසයි (Bartelmus, 1994: 01). මිනිසුන්ගේ ජීවන තත්වය නංවාලීමට භාණ්ඩ හා සේවා පහසුකම් ලබා ගැනීමට ඇති ශක්තිය වැඩිකල යුතුයි. ඒ තුළින් රටක දළ ජාතික නිෂ්පාදිතය වැඩි වී ආදායම් තත්වයන් ඉහළ යන බව ඔවුන් ආර්ථික දෘෂ්ටිකෝණයකින් පෙන්වා දේ. එහෙත් සංවර්ධනය යනු ආර්ථිකමය සංවර්ධනය පමණක් නොවන බව

ඇතැම්හු පෙන්වා දී තිබේ. ඒ අනුව ආර්ථික විද්‍යාඥයකු වූ ගුනර් මිර්ඩාල් සංවර්ධනය යනු "සමස්ථ සමාජ ක්‍රමයේම ඉදිරි ගමන හෝ විප්ලවීය වෙනස්වීමක්" ලෙස නිර්වචනය කර ඇත (අත්තනායක, 2010: 2). ඒ තුළින් පැහැදිලි වන්නේ සංවර්ධන ක්‍රියාවලිය සමස්ථ සමාජ ක්‍රමයේම ඇති විය යුතු විප්ලවකාරි ඉදිරි ගමනක් වන අතර මානව සමාජයට එයින් පහසුවෙන් ජීවත් වීමට ඇති හැකියාවයි.

සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් සංවර්ධනය යනු සංස්කෘතික හා සදාචාරාත්මක වශයෙන් සමාජයක කටයුතු සියල්ලගේම ඉදිරියට පැමිණීමක් ලෙසයි (ගුණවර්ධන, 1993: 68). මෙම පදනම මත පැහැදිලි නිර්වචනයක නිරතවන ආචාර්ය සලීමා ඕමාර් පෙන්වා දෙන්නෙ "මානව ගරුත්වය, සමතාවය, සමාජ සාධරණත්වය යන මූලධර්ම පදනම් කරගෙන සමාජයේ සිදුවන සංගෘහිතවූත්, සමතුලිතවූත්, ඒකාබද්ධවූත් වර්ධනය සංවර්ධනය" ලෙසය (අත්තනායක, 2010: 2). මානව ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් ද පැහදිලි වන්නේ සමාජය තුළ ගොඩනැගෙන පුද්ගල ගරුත්වය, සමතාවය වැනි ආගමික හෝ මතවාදි අවශ්‍යතාවයන් පුද්ගලයාගේ කාර්යක්ෂම බව කාර්මීකරණය, නාගරීකරණය වැනි තත්වයන් දක්වා සංවර්ධනය වී ඇති බවයි. ඒ සඳහා සමාජ හා මනෝ විද්‍යාත්මක කරුණුවලින් ලත් පෝෂණය ඉවහල් වී ඇති බව සමාජ විද්‍යාඥයින් පෙන්වා දේ (Thorpe, 1988).

සංවර්ධනය පිළිබඳව පවතින ඉහත සියලු නිර්වචන සැලකිල්ලට ගැනීමේ දී වඩාත් පැහැදිලි වන්නේ මානව සංහතියේ සමාජ, ආර්ථික හා අධ්‍යාත්මික ප්‍රගතිය එයින් අවධාරණය වී ඇති බවයි. එය කිසියම් ස්ථරයකට හෝ කිසියම් කණ්ඩායමකට හෝ කිසියම් ප්‍රදේශකට හෝ සීමා නොවිය යුතුය. සමස්ථ සමාජයේ සියලු දෙනා අතරට ගිය සමාජ සාධරණත්වයකින් යුක්ත වුවක් විය යුතුය.

**සාකච්ඡාව**

සංවර්ධනයේ ප්‍රතිලාභ දරිද්‍රතාවයෙන් යුත් සමාජයන්ට ද ලැබෙන සේ ක්‍රමවේද සකස්කර ක්‍රියාත්මක කිරීම නූතන සංවර්ධන ව්‍යාපෘති සැලසුම්කරුවන්ගේ ප්‍රතිපත්තිමය තීරණයකි. එම දර්ශනය ඇතිව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වුවත් බොහෝ අවස්ථාවල

සංවර්ධන වැඩසටහන් නිසි අරමුණු කරා ළඟා නොවීය. එයට හේතු පිළිබඳ විමසීමක යෙදෙන සමාජ විද්‍යාඥයින් පෙන්වා දෙන්නේ සැළසුම් සහගත සංවර්ධන ක්‍රියාදාමය තුළ ප්‍රතිලාභී කණ්ඩායම්වල සහභාගීත්වය පිළිබඳව අවධානය යොමු නොකර ඇති බවයි. සංවර්ධනය පිළිබඳව මුල්කාලීන ක්‍රමවේදයන් හී අවධානය යොමුකරන ලද්දේ ඉහළ සිට පහළට දිව යන ප්‍රතිපත්තිහි සැලසුම් සම්පාදන ක්‍රියාදාමයකටය (Top down Approach ). එය හැඳින්වූයේ නිළධාරී කේන්ද්‍රීය සංවර්ධන ප්‍රවේශය ලෙසිනි (සමරකෝන්, 2018). එම ප්‍රවේශයේ ඇති අසාර්ථකභාවය නිසා මහජන සහභාගීත්වය ඇති පහළ සිට ඉහළට ක්‍රියාත්මක සහභාගීත්ව සංවර්ධනය (Participatory development) සංවර්ධන ක්‍රියාදාමයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන සේම ජාත්‍යන්තර සංවර්ධන සංවිධානයන් විසින් පසුගිය දශක කිහිපය තුළ අවධාරණය කරන ලදි. එය ප්‍රජා සහභාගීත්වය යන්න සංවර්ධන ක්‍රියාදාමය තුළ අත්‍යාවශ්‍ය අංගයක් බවට පත්ව ඇත (අබේවික්‍රම, 2010: 149). එම නිසා සහභාගීත්ව සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න පිළිබඳව ද මූලිකව අවධානය යොමු කළ යුතුවේ.

සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වය ලබාගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමුවුයේ ක්‍රමයෙන් ඉහළ ගිය ජන සංඛ්‍යා වර්ධනය, සම්පත් සීමිත වීම සහ ඒ වටා ඇති වු දේශපාලන, ආර්ථික හා සමාජමය සංවාද නිසා සිදු වූ වෙනස්කම්ය. ප්‍රජා සහභාගීත්ව සංවර්ධනය යන පදය ජාත්‍යන්තර වශයෙන් වැදගත් වී ඇත්තේ 1948 වර්ෂයේ අප්‍රිකානු පරිපාලනය පිළිබඳ කේම්බ්‍රිජ් සම්මන්ත්‍රණයෙනි (Cambridge Conference an African Administration, conducted by the British colonial office) මෙහිදී ජනතාවට අධ්‍යාපනය ලබාදීමෙන් තමතමන්ගේ උත්සාහයෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කරගැනීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමුකර ඇත (Chikki, 1979). 1971 දී එක්සත් ජාතින්ගේ සංවිධානය නිකුත් කළ “Popular participation in Devolopment” නැමැති ප්‍රකාශනයෙහි ප්‍රජා සහභාගීත්වය, සංවර්ධන ක්‍රියාදාමය තුළ ඉතා වැදගත් තැනක් ගන්නා බව දක්වා ඇත. මීට අමතරව 1975 දී “Popular Participation in Decision – Making For Development” නමින් එම සංවිධාන විසින්ම නිකුත් කළ ප්‍රකාශනයෙහි, එක්සත්

ජාතින්ගේ සංවිධානය විවිධ රටවල ආණ්ඩුවලට ප්‍රජා සහභාගීත්වය සහ එහි අවශ්‍යතාවය පිළිබඳව සඳහන් කර තිබේ.

ප්‍රජා සහභාගීත්ව සංවර්ධනය පිළිබඳ මෙසිරොව් සඳහන් කරන්නේ එය සැලසුම් සහගත සමාජමය හෝ එක්තරා ජනකොටසක් හෝ වෙනස් කිරීමේ ක්‍රියාවලිය ලෙසයි (Mezirow, 1963). ඒ තුළ ප්‍රජාවේ ශක්තිය බැලූ බැල්මට නොපෙනෙන අතර එය මතු කර ගත යුත්තකි. එම නිසා ප්‍රජා සංවර්ධනයේ ප්‍රධාන අරමුණු වන්නේ ප්‍රජාව දැනුවත් කිරීම හා ඔවුන්ගේ සංවර්ධනය කරා යොමුවන මාර්ගය පෙන්වා දීමයි. ඒ අනුව ප්‍රජා සහභාගීත්ව සංවර්ධනය යනු ප්‍රජාව තම තමන්ගේ අවශ්‍යතා ගැටලු හඳුනාගෙන සැලසුම් සහගතව ඒවා විසඳා ගැනීම සඳහා ප්‍රජාව සතු සම්පත් හා අවශ්‍ය විටක රාජ්‍ය හෝ රාජ්‍ය නොවන වෙනත් ආයතනයන්ගේ ද උදව් උපකාර ඇතිව ක්‍රියාවට නගන සමාජ ක්‍රියාවලියක් ලෙස බව පැහැදිලිය (සමරකෝන්, 2018).

ජාතික සංවර්ධන උපක්‍රමවල මූලික ප්‍රතිපත්තිමය මිනුමක් ලෙස "ප්‍රජා සහභාගීත්වය" ඇතුළත් කළ යුතු බවත්, සංවර්ධන ක්‍රියාදාමයේ අරමුණු පැහැදිලි කිරිම, ප්‍රත්පත්ති සකස් කිරීම සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම පුද්ගලයින්ගේ පුළුල් හා ක්‍රියාකාරි ලෙස සහභාගීත්වය ලබාගැනීමට ධෛර්යමත් කළ යුතු බවත් එහි සඳහන් වේ (නානයක්කාර, 2003: 32).

සහභාගීත්ව සංවර්ධනය යනු කුමක් ද යන්න පිළිබඳව ඉදිරිපත් කර ඇති නිර්වචනයන් විමසීමේ දී ඒ පිළිබඳව පූර්ණ අවබෝධයක් ඇති කරගත හැකිය. "සහභාගීත්ව සංවර්ධනය යනු විවිධ බලවේගයන් විසින් කාලයක් තිස්සේ යටපත් කරනු ලැබතිබූ බෙලහීන ජනතාවගේ සැඟවුණු නිර්මාණාත්මක කුශලතාවන් සාමුහික ප්‍රයත්නයන් මඟින් ඉස්මතු කර ගනිමින් ඔවුන්ට වාසි දායක වන අයුරින් පවතින තත්වයේ වෙනසක් ඇති කරමින් ඔවුන්ගේම කතෘත්වයෙන් බිහිවන සංවර්ධන ක්‍රියාවලියයි" (කරුණාරත්න, 1998:14).

මෙම නිර්වචනයෙන් පෙන්වා දී ඇත්තේ සංවර්ධනය යනු බාහිර බලවේගයකින් ජනතාව මත ඔවුන්ගේ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් පටවන දෙයක් නොව එම බලවේග මගින් යටපත් කරන ලද ජනතාවගේ සැඟවුන හැකියාවන් හා ශක්තීන් යොදා

ගනිමින් ඔවුන්ගේ කතෘත්වයෙන් ඇති කර ගන්නා දෙයක් බවයි. එය පිටතින් ආනයනය කළ නොහැක්කකි. සංවර්ධනය පිටතින් ආනයනය කළ නොහැක්කක් ලෙස සලකුණු ලබන්නේ පිටතින් සැලසුම් කළ ක්‍රමවේදයන් ප්‍රජාවට එකතු කිරීම සැබෑ අවශ්‍යතාවයන් ඉටු කිරීමක් නොවන නිසාය. එබැවින් ප්‍රජාව තුළ ඔවුන් පිළිගත් අදහස් හා යෝජනා ක්‍රියාත්මක කිරීම සහභාගීත්ව සංවර්ධනයේ සුවිශේෂී ලක්ෂණයක් ලෙසට පෙන්වා දිය හැකිය.

සහභාගීත්ව සංවර්ධනය යන්නට වැදගත් අර්ථකථනයක් ලබාදුන් Robert Chambers සංවර්ධනයේ දී සහභාගීත්වය සිදු වන ආකාරය තර්කානුකූල විග්‍රහයන් ප්‍රධාන තේමාවන් තුනක් ඔස්සේ පෙන්වා දී ඇත (Chambers, 1981: 18).

01. Cosmetic Value Participation (අලංකාරය සඳහා සහභාගීත්වය).

සමහර ව්‍යාපෘතීන්වල දී අදාළ ව්‍යාපෘතියේ ක්‍රියාධරයන් විසින් තමන් දියත් කිරීමට යන ව්‍යාපෘතිය ඉතා වැදගත්වන බව පෙන්වීමට සහ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය දායකත්වය දරන ආයතනයන් ආකර්ෂණය කරගැනීම සඳහා පමණක් ප්‍රජා සහභාගීත්වය යොදා ගැනීම.

02. Passive Participation (අක්‍රීය සහභාගීත්වය).

තවත් සමහර ව්‍යාපෘතිවල ජනතා සහභාගීත්වය සංවර්ධන සඳහා යම් මට්ටමකින් දැකිය හැකිවන අතර එහි අක්‍රමවත් හා අක්‍රීය බවක් දැකිය හැකිය. මෙවැනි ව්‍යාපෘතියක දි බොහෝ දුරට සිදුවන්නේ ප්‍රජාවගේ අදහස් හා මතවාද වලට ඉඩක් නොතිබීමයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමට පමණක් සහභාගීත්වය අවශ්‍ය නිසා යොදා ගනී. මෙවැනි අවස්ථාවල ප්‍රතිලාභී කණ්ඩායම්වල අදහස වන්නේ ''අපි ඔවුන්ගේ ව්‍යාපෘතිය සඳහා සහභාගිවනවා පමණයි අපට අවශය දේ එම ව්‍යාපෘතියෙන් ඉටු නොවන බවයි''. එවැනි ව්‍යාපෘතීන් සංවර්ධන කාර්යයේ දී අසාර්ථක වේ.

03. Active Participation (සක්‍රීය සහභාගීත්වය).

මෙවැනි ව්‍යාපෘතියක දැකිය හැක්කේ ප්‍රතිලාභීන් සක්‍රීය අකාරයෙන් සහභාගී කරගන්නා බවයි. එහි දී විශේෂයෙන්ම ප්‍රතිලාභීන්ගේ අදහස් හා යෝජනාවන්ට විශේෂ තැනක් ලැබෙන අතර ඔවුන් අතුරින්ම ඒ සඳහා සැලසුම් සකස් කරගැනීම හා ක්‍රියාවට නැංවීමේ දී ද ඔවුන්ගේ මූලිකත්වයෙන් සිදුවන ආකාරය දැකිය හැකිය. මෙහි දී දැනුම, ආකල්ප, චර්යාවන්, ඇගයුම්වලින් සාමාන්‍ය ප්‍රජාව බලගැන්වීමක්, දිරි ගැන්වීමක් කරන අතර ඔවුන්ට ඔවුන් පිළිබඳ යම් මට්ටටමක ධනාත්මක ආකල්පයක් ඇති කරමින් ස්ව ශක්තිය හා විශ්වාසය වර්ධනය කරගැනීමට ද හැකියාව පවති. එය ව්‍යාපෘතියේ සක්‍රීය සහභාගීත්වයේ ඇති වාසියයි.

මෙසේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රජා සහභාගීත්වය පිළිබඳව පැහැදිලි අවධානයක් නොමැති වුවත් එසේ සහභාගීත්වය මානව අයිතිවාසිකමක් ද වන බව සමාජ විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි (අබේවිකම්, 2010). 1984 දී ප්‍රකාශයට පත් කරන ලද "Community Participation in the Executive of Low – Income Housing Projects" නැමැති ප්‍රකාශයෙහි මේ හා සම්බන්ධ අදහස් කිහිපයක් ඉදිරිපත් කර ඇත.

> ප්‍රජාවගේ ජීවිතවලට බලපාන විශේෂයෙන් ප්‍රජා සංවර්ධනය මුල්කරගත් ක්‍රියාවලදී ඊට සහභාගී විමට පූර්ණ අයිතියක් ඇති අතර, එය ඔවුන්ගේ වගකීමක් ද වනු ඇත.
>
> සහභාගීත්වය, ව්‍යාපෘති ප්‍රතිඵල සාර්ථක කරන ප්‍රධාන ක්‍රමවේදයකි. සිය අව්‍යාජමය වු ශිල්පීය හැකියාවන් සහ මෙතෙක් ප්‍රයෝජනයට නොගත් සම්පත් සහිතව ව්‍යාපෘති ක්‍රයාත්මක කිරිමට සහභාගීවනු ඇත. එහි දී ඔවුන්ගේ අවශ්‍යතා සහ මුලිකත්වය දිය යුතු අංශ ව්‍යාපෘති ප්‍රතිඵල තුළින් දෘශ්‍යමාන වේ.
>
> සහභාගීත්වය, ස්වයං සදාතනික වු ක්‍රියාවක් වන අතර එය ප්‍රජාවට පුළුල් ලෝකයක් දැකීම සඳහා උත්තේජනය කරවයි.

එකමුතු බවේ සහ ස්වශක්තියේ බලය සහභාගීත්වය මගින් වර්ධනය කරන අතර, ඒ තුළ ඇති ඉගෙනීමේ ක්‍රියාදමයන් විසින් ප්‍රජාවේ ගැටළු හඳුනාගැනීමේ සහ ඒවා විසඳාගැනීමේ ක්‍රියාවලියට අවතීරණය වීමට සුදුසු පුද්ගලයින් බවට පත් කරවයි (නානයක්කාර, 2003: 34).

සහභාගීත්ව සංවර්ධනය සෘජුවම සිදුවීමේ වැදගත්කම පෙන්වා දී ඇත්තේ සංවර්ධන ව්‍යාපෘතිවල දී ජනතාවගේ මැදිහත්වීම අත්‍යාවශ්‍ය අවස්ථාවක් වීමයි. සහභාගීත්ව සංවර්ධනයේ දී ජනතාවගේ සහභාගීත්වය ලැබිය යුතු ප්‍රධාන අවස්ථා කිහිපයක් හඳුනාගත හැකිය. එනම්,

සැලසුම් කිරීමේ දී

ක්‍රියාත්මක කිරීමේ දී

ප්‍රතිලාභ බෙදා ගැනීමේ දී

ඇගයිමේ දී (සමරකෝන්, 2018: 11)

මේ සියලු කරුණ අනුව පැහැදිලි වන්නේ ප්‍රජාව ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වන ඕනෑම සංවර්ධන කාර්යයක දී සංවර්ධනය පිළිබඳව තීරණ ගැනිම, සාකච්ඡා කිරීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රතිලාභ බෙදා ගැනීම, ඇගයීම හා පසුවිපරම යන සියලුම අවස්ථාවන්හී දී ප්‍රජාව සහභාගීකරගත යුතු බවයි. එසේ ප්‍රජාවට මූලිකත්වය දීම සඳහා ඔවුන් සහභාගි කරගැනීමේ දී විශේෂයෙන් අවධානය යොමු කල යුතු ක්‍රමවේදයක් ද හඳුන්වා දී ඇත. එය සහභාගීත්ව ගැමි පිවිසුම් ක්‍රමවේදය (Participatory Rural Appraisal) යනුවෙන් හඳුන්වයි. සහභාගීත්ව ගැමි පිවිසුම් ක්‍රමවේදය මඟින් සිදුවන්නේ යම්කිසි ජන කොටසක් ගැඹුරින් වටහා ගැනීම උදෙසා කරනු ලබන කිසියම් ආකාරයක තත්ත්ව පරීක්ෂණමය ක්‍රියාවලියක්ය. එසේත් නැතිනම් සංවර්ධන ක්‍රියාධරයින් රැසක් ප්‍රජාවගේ තොරතුරු සොයා ගැනීම යොදාගනු ලබන ගුණාත්මක පිවිසුමකි. මෙම ක්‍රමවේදය වර්තමාන තත්වයට සංවර්ධනය කරන ලද්දේ රොබට් චෙම්බර්ස්ය (නානයක්කාර, 2003: 42).

විවිධ ගැමි පිවිසුම් ක්‍රමවේදයන් සංවර්ධන ක්‍රියාවන්හී නූතනයේ භාවිත කරන බව පෙනේ. මෙම සියලුම ක්‍රමවේදයන් ප්‍රධාන අංග හෙවත් විධික්‍රම තුනක් මත පදනම් වී ඇත. එනම්,

අවකාසීය සම්බන්ධිත ගැමි පිවිසුම් ක්‍රමවේදය

කාලය සම්බන්ධිත ගැමි පිවිසුම් ක්‍රමවේදය

සහසම්බන්ධතා ක්‍රමවේදය යනුවෙනි (සමරකෝන්, 2018: 34).

අවකාසීය සම්බන්ධිත ගැමි පිවිසුම් ක්‍රමවේදයේ දී ව්‍යාපෘති ක්‍රියාත්මක වන අවකාශය තේරුම් ගැනීමට උත්සාහ කරනු ලබයි. නිවාස ඉදිකර ඇති ආකාර, නිවාසවල තත්ත්වය, කෘෂිකාර්මික සම්බන්ධතා, සම්පත් භාවිත කිරීමේ ස්වභාවය යනාදිය කෙරෙහි අවධානය යොමුකරනු ලබයි.

කාලය සම්බන්ධිත ගැමි පිවිසුම් ක්‍රමවේදය යනු කාලීන කටයුතු පිළිබඳ දැනුවත් භාවයයි. ප්‍රජාව තම වෘතීන්වල නිරතවන කාලය හා විවේකීව සිටින කාලය පිළිබඳව අවබෝධයක් ඇති කරගත යුතුයි. මෙහිදී ප්‍රජාව කාර්යබහුල අවස්තා හා එසේ නොවන අවස්තා හඳුනාගත හැකි අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී එදිනෙදා කටයුතුවලට බාධා නොවන ආකාරයට සැලසුම් කිරීමට හැකියාවක් එයින් ඇති වේ.

සහසම්බන්ධතා ක්‍රමවේදය මගින් ප්‍රජාවගේ සාමුහීකත්වය හා එකිනෙකා අතර පවත්නා සම්බන්ධතාව හඳුනාගත හැකිය. එමෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන මෙන්ම ස්වේච්ඡා සංවිධාන සමග ප්‍රජාවගේ සම්බන්ධතාව ද හඳුනාගැනීම ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ඉතා වැදගත් ය.

ගැමි පිවිසුම් ක්‍රමවේද මඟින් ගැමියන් අතරට ගොස් සංවර්ධන ව්‍යාපෘති සාර්ථක කරගැනීමට විශේෂයෙන් අවධානය යොමු කළ යුතු කණ්ඩායම් කිහිපයක් ඇත. ඒ අතර

සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ ආගමික නායකත්වය.

ප්‍රදේශයේ වැඩිහිටි නායකයන් හා ප්‍රභු පිරිස්.

තරුණ තරුණියන්,

කාන්තාවන්.

යන අංශ පෙන්වා දිය හැකිය. මෙහි ක්‍රියාකාරි සහභාගීත්වය මඟින් සංවර්ධන ව්‍යාපෘති සාර්ථකත්වය කරා ගෙනයාමට හැකියාව පවති.

රටක ආගමික නායකත්වය යනු එම රටේ ශක්තියයි. රටේ සියලු ප්‍රජාව ඒකරාශි වී ගොනු වී සිටින්නේ එම රටේ නායකත්වය සමඟය. විශේෂයෙන්ම තුන්වන ලෝකයේ බොහෝ රටවල මෙම ස්වරූපය බහුල වශයෙන් දැකිය හැකිය. සංවර්ධනය විය යුතු රටවල් ලෙසට හඳුනාගෙන තිබෙන මෙම රටවල්වල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රජා සහභාගිත්වය අපේක්ෂා කරන්නේ නම්, ආගමික නායකත්වයේ මඟ පෙන්වීම හා අවවාද අනුශාසනාව අවශ්‍ය වේ. මන්ද ආගමික නායකයන් ප්‍රජාවගේ අවශ්‍යතාවයන් ගැන මෙන්ම, ඔවුන්ගේ ආකල්ප හා හැකියාවන් පිලිබඳව මනා වැටහීමකින් සිටි. එම නිසා සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳව මුලිකව, ප්‍රතිලාභ ලබන ප්‍රදේශයේ සියලු ආගමික නායකයන් ඒකරාශි කරගෙන සාකච්ඡා කිරීම ඉතා වැදගත්ය. ඔවුනට ඒ සම්බන්ධයෙන් පුළුල් අවබෝධයක් ලබාදීම තුළ ප්‍රජාව හා සම්බන්ධවීම වඩාත් පහසු වේ.

සාමාන්‍යයෙන් ආගමික නායකයාට ගමේ පරිසරය පිළිබඳව පුළුල් අවබෝධයක් තිබේ. ගමේ තිබෙන ස්වභාවික සම්පත් පිළිබඳව මෙන්ම එහි වටිනාකම පිලිබඳව ද දැන සිටි. එසේම ප්‍රජාවගේ පොදු අවශ්‍යතාවයන් පිළිබඳව ද හොඳ වැටහීමක් පවති. එම අවශ්‍යතාවයන් බහුල වශයෙන් තිබිය යුත්තේ කුමන ප්‍රදේශයේ ද යන වග හඳුනාගෙන තිබෙන්නේ ද ඔවුන්ය. එ පමණක් ද නොව ප්‍රජාව ඒකරාශි කරගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ශක්තියක් ද ආගමික නායකයන් තුළ පවති. ඔවුන් ප්‍රජාව අතුරින් නියම දක්ෂයන් හඳුනා ගෙන සිටිම

ද ඉතා වැදගත්ය. එසේම ආගමික නායකයන්ගේ වචනය ඉහළින්ම පිළිගන්නා ආකාරයක් දකිය හැකිය. එම නිසා ප්‍රජාව ඒකරාශි කරගැනීමට අපහසු වන්නේ ද නැත. මේ අනුව පෙනී යන්නේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දි ආගමික නායකත්වය ඉතා වැදගත් කාර්යභාරයක් ප්‍රජා සහභාගීත්ව සංවර්ධනයට ඉටු කරන බවයි.

සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශයක ක්‍රියාත්මක කිරිමට යාමේ දී එම ප්‍රදේශයේ වැඩිහිටියන් හා ප්‍රභූන් සම්බන්ධ කරගැනීම ඉතාමත් වැදගත්ය. ගමක සාමාන්‍යයෙන් වැඩිහිටියන් ගමේ ඉතිහාසය හොඳින් දනි. යම් අවස්ථාවක මෙවැනි ව්‍යාපෘති මීට පෙර ක්‍රියාත්මක කර තිබේ ද, එසේ නම් ඒවා අසාර්ථක වීමට හේතු යනා දී යටගියාවන් රැසක් පිළිබඳව අවබෝධයක් ඇතිකර ගැනීමට ගමේ වැඩිහිටි හා ප්‍රභූ නායකත්වයේ සහාය ඉතා වැදගත්ය. එ පමණක් ද නොව සාම්ප්‍රදායික ගම්මානවල තවමත් වැඩිහිටියන්ගේ අදහස් හා ආකල්පවලට වැඩි තැනක් ලැබෙන බව පෙනෙන කරුණකි. එවැනි තත්වයක් මත ඔවුන්ගේ සහභාගීත්වය සංවර්ධන ව්‍යාපෘති සාර්ථක කරගැනීමට මහත් පිටුවහලක් වේ.

එසේම සහභාගීත්ව සංවර්ධනයේ දී තරුණ සහභාගීත්වය කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කල යුතු වේ. ඕනෑම සමාජයක වැඩදායි මෙහෙවරක් සිදුකිරීමේ ශක්තිය තිබෙන්නේ තරුණ පිරිසටයි. මේ නිසා සංවර්ධන කාර්යේ දී මොවුන්ගේ සහයෝගය නිසි පරිදි ලබා නොගන්නේ නම් ඉන් සිදු වන්නේ වටිනා සම්පතක් මග හැරීමකි. සංවර්ධන ව්‍යාපෘති සකස් කිරීමෙන් මෙන්ම සැලසුම් කිරීමේ දී ද තරුණ කණ්ඩායම් ඉලක්ක කරගෙන සිදු කල යුතු වේ. එවිට ඔවුන්ගේ වැඩි දායකත්වයක් ලබාගැනීමට හැකියාවක් තිබේ. නූතන තරුණයා සමාජය පිළිබඳව පුළුල් අවබෝධයක් ලද්දෙකි. ලෝක ප්‍රවණතාවයන්ට අනුව හැඩ ගැසීමේ හැකියාවක් ඇත. ඔවුන් නායකත්වය දැරීමට මෙන්ම ක්‍රියාකාරී සමාජිකත්වයක් දැරීමට ද සුදුසුය. නගරය හා බාහිර ලෝකය සමග ගම සම්බන්ධ කරන පුරුකක් ලෙස ද ක්‍රියා කරයි. නගරය විසින් ගැමි සාරය උරාගන්නේ යැයි, ගම සූරා කන්නේ යැයි කතා කරන මෙවන් අවධියක දී නගරයෙන් ගම සඳහා අදහස් වශයෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ යමක් උකහා

ගැනීමට ඉදිරිපත් වන්නෝ තරුණයෝ ය. මේ නිසා සංවර්ධනය අරමුණු කරගත් ඕනෑම කටයුත්තකදී තරුණ සහභාගීත්වය මහඟු සම්පතක් කොට සැලකිය යුතුය.

කාන්තා සහභාගීත්වය සංවර්ධන ක්‍රියා දාමයේ දී අවශ්‍ය සාධකයක් ලෙස නූතන සමාජ විද්‍යාඥයින්ගේ අදහසයි. සාම්ප්‍රදායික සමාජවල කාන්තාව එක රාමුවකට පමණක් කොටුකර තබා සිටිය ආකාරයක් දකගත හැකිවිය. එහෙත් වර්තමානයේ පුරුෂයා මෙන්ම කාන්තාව ද ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ වීමේ ලක්‍ෂණ ලෝකයේ සෑම රටකම පාහේ දක්නට ඇත. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වර්තමාන තරුණ ජනගහනයෙන් වැඩියෙන්ම රාජ්‍ය අංශයේ රැකියා සඳහා ප්‍රවේශ වී සිටින්නේ කාන්තාවයි. එම නිසා සංවර්ධන ව්‍යාපෘති සකස් කිරීමේ දී හා ඒවා සැලසුම් කිරිමේ දී කාන්තා දායකත්වම ඉලක්ක කරගැනීම ඉතාමත් වැදගත්ය. එසේම ව්‍යාපෘතියේ අවසානය දක්වාම ඇගේ සහභාගීත්වය ලබා ගැනීමට ව්‍යාපෘතියේ සක්‍රිය සාමාජිකතත්වයක් හා වැඩකොටස් ලබාදිය යුතුයි. කාන්තාවන් සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී ආන්තිකරණය වීමට හේතුව වී ඇත්තේ අන් අය විසින් ඉටුකරන තෙක් බලා සිටිමයි. එහෙත් සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලිය විසින් මෙම තත්ත්වය ප්‍රතික්ෂේප කරන අතර දිළිඳු ජන කොටස් සංවර්ධනයේ විපර්යකාරකයින් ලෙස පිළිගනු ලබයි.

**නිගමනය**

සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ දී ඉතා වැදගත් අංශයක් වන්නේ ප්‍රජාව ඉලක්ක කරගෙන ප්‍රජාවට ප්‍රතිලාභ ලැබෙන ආකාරයෙන් සංවර්ධන ව්‍යාපෘති යෝජනා වීමයි. ප්‍රජාව ඉලක්ක කරගෙන සිදුකරන සංවර්ධන යෝජනාවන්වල දී ප්‍රජාවගේ අදහස් හා යෝජනාවන්ට ප්‍රමුඛතාවයක් දිය යුතුය. සංවර්ධන සැලසුම් සකස් කළ යුත්තේ ප්‍රජාවගේ ද අදහස් විමසීමෙනි. එමෙන්ම ප්‍රජා සංවර්ධන ක්‍රියාවලියේ දී ප්‍රජා සහභාගීත්වය වැදගත් ය. ප්‍රජා සහභාගීත්ව ක්‍රියාවලිය සඳහා වැදගත් න්‍යායාත්මක ප්‍රවේශයක් ලෙසින් ගැමි විමසුම් ක්‍රමවේදය පෙන්වාදිය හැකිය. මේ ආකාරයට සංවර්ධන ව්‍යාපෘතියක් සාර්ථක කරගැනීමේ දී ප්‍රජා සහභාගීත්ව සංවර්ධනය

අත්‍යාවශය කාරණාවක් වන අතර එහි දී ගැමි විමසුම් ක්‍රමවේදයන් තුළින් ප්‍රජාව හඳුනාගෙන ඔවුන්ගේ පූර්ණ සහයෝගය ලබාගත යුතුය. විශේෂයෙන්ම ආගමික නායකයන්, වැඩිහිටියන්, තරුණ තරුණියන් හා කාන්තාවන් සම්පත් දායකයන් ලෙස යොදා ගැනීම අතිශයින්ම ඵලදායික වේ. එයින් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී මෙන්ම සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී හා ප්‍රතිලාභ බෙදීමේ ද, පසුවිපරමේ දී ද ඉතා වැදගත් ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අත්තනායක, බී. (2010). සංවර්ධන සන්නිවේදන හා සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති සැලැසුම්කරණය, වරකාපොළ: ආරිය ප්‍රකාශන.

අබේවික්‍රම, සී. (2010). සහභාගීත්ව සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලාංකික ව්‍යාපෘතියක අත්දැකීම්, සමාජ විමසුම, පළමු කලාපය, අංක 14, පේරාදෙණිය: පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව. .

කරුණාරත්න, විල්ප්‍රඩ්, (1998). ප්‍රජාතන්ත්‍රවාදය හා සහභාගිත්ව සංවර්ධනය. කොළඹ: පියසිරි ප්‍රකාශන.

ජයසිංහ, ආර්. (2014). ප්‍රජා සංවර්ධනය සඳහා සමාජ වැඩ විධික්‍රම. කර්තෘ ප්‍රකාශන.

නානායක්කාර, වසන්ති. (2003). සහභිගීත්ව ප්‍රජා සංවර්ධනය, කර්තෘ ප්‍රකාශන.

සමරකෝන්, එම්.(2018). ප්‍රජා සහභාගීත්වය හා ගැමි පිවිසුම් ක්‍රමවේදය. කර්තෘ ප්‍රකාශන.

Bartelmus,P.(1994), Environment Growth and Development, The Concepts and Strategies of Sustainability, London: Routledge.

Chikki,D.A. (1979). Community Development. Village Publishing House: New Delhi.

Glod Thorpe, J. E,(1988). Some Psychological Aspects of Change. Lodon: University Press.

Chambers, R. (1981). Rural Development, putting the last fitst. London: Longman.